# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2013 මාර්තු මස 05 වන දින  පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් **2013.02.19** දින අසන ලද ප්‍රශ්නය:

**(ප්‍ර/V (1)13/02)**

අ. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ බස්නාහිර පළාතේ පාසැල් පරීක්ෂා කිරීම සඳහා විශේෂ පරීක්ෂණ කණ්ඩායමක් ක්‍රියාත්මක වන බව පිළිගන්නේද?

ආ. එම පරීක්ෂණ කණ්ඩායම 2012 වසර තුළ කැළණිය අධ්‍යාපන කලාපයේ පාසැල් පරීක්ෂා කළේද ?

ඇ. එසේනම් ඒ කුමන පාසැල් දැයි නම් කළ හැකිද?

ඈ. එසේ පාසැල් පරීක්ෂා කරන ලද දිනයන් හා පාසැල් වල නම් සඳහන් කරන්නේද?

ඉ. එම පරීක්ෂණ කණ්ඩායම්වල නිලධාරීන්ගේ නම් හා තනතුරු සඳහන් කරන්නේද ?

ඊ. එම පරීක්ෂණයන්හි ප්‍රගතිය පිළිබඳ සාරාංශ වාර්තාවක් ලබාදෙන්නේද ?

- **සභාව කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්ණ :**

**02.** ගරු ඊ.සිරිකමල් ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් **2013.02.19** දින සභාව කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්ණය :

**(ප්‍ර/V(1)13/ADG01)**

අ. බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත 2012 වසරේ පළාත් සභාව මගින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද ?

ආ. එම මුදල් ප්‍රමාණය වෙන් කරන ලද්දේ කුමන ආකාරයකටද ?

ඇ. (i) භෞතික සම්පත් දියුණු කිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද ?

(ii) එම මුදල සම්පූර්ණයෙන් වැය කර තිබේද ?

ඈ. (i) පළාත් සභා ප්‍රතිපාදනවලට අමතරව වෙනත් ආකාරයකින් ප්‍රතිපාදන ලැබුනේද ?

(ii) එසේ නම් ඒ කොපමණ ද ?

(iii) ඒ කුමන මාර්ග වලින්ද ?

ඉ. (i) 2013 වසරේදී අධ්‍යාපන විෂය සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද ?

(ii) භෞතික සම්පත් වැඩි දියුණු කිරීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද ?

(iii) පළාත් සභා ප්‍රතිපාදනවලට අමතරව වෙනත් ආකාරයෙන් මුදල් ලැබීතිබේද?

(iv) ඒ මොනවාද ?

**03.** ගරු ඊ.සිරිකමල් ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් **2013.02.19** දින සභාව කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්ණය :

**(ප්‍ර/V(1)13/ADG02)**

අ. 2012 වසරේ බස්නාහිර පළාතේ පාසල්වල තීන්ත ආලේප කිරීම සඳහා වියදම් කල මුදල කොපමණ ද ?

ආ. එම මුදල් ලබා දෙන ලද්දේ කුමන වැඩ සටහනක් යටතේ ද ?

ඇ. පළාතේ පාසල් කොපමණ සංඛ්‍යාවක් සඳහා මෙම මුදල් ලබා දුන්නේ ද ?

ඈ. ලබා දුන් මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වැඩිපුර මුදල් අයකිරීමට බලධාරීන් වෙත උපදෙස් හෝ බලය ලබා දී තිබුනේද ?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු එම්.එම්.එම් අම්ජාඩ් මන්ත්‍රීතුමා :**

" අද පළාත් පාලන ආයතන සතු මාර්ගයන්හි විශාල සංවර්ධනයක් සිදු වෙමින් පවතී. " මඟ නැඟුම ", " ගම නැඟුම ", " පළාත් නිශ්චිත සංවර්ධන " ආදී වශයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධනයක් සිදුවේ.

නමුත්, අද පළාත් පාලන ආයතන, මාර්ග අලුත් වැඩියා හා නඩත්තු කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දීම අවම මට්ටමකට පත්වී ඇත. යම් යම් මාර්ග නඩත්තු කටයුතු සම්පූර්ණයෙන්ම නොසලකා හැරීම මත එම මාර්ගයන් බාදනයට ලක්ව දැඩි අබලන් තත්වයට පත්වී ඇති අවස්ථා අප විසින් දැක ඇත.

එම නිසා සෑම පළාත් පාලන ආයතනයකම මාර්ගයන්හි දෛනික නඩත්තු කටයුතු ඒකක ස්ථාපිත කර එම මාර්ග අවම මුදලක් වියදම් කර ආරක්ෂා කර ගැනීමටත් ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනයන්හි කාර්යක්ෂමතාවය ඇගයීම් කිරීමටත් බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් අධීක්ෂණ ඒකකයක් ඇති කල යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

**(යෝ/v(01)12/15)**

**02. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා :**

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල මෑත කාලයේ අර්බුද රැසක් පැන නැගිණ. රටේ ඉහළම බුද්ධිමය සම්පත වන විශ්ව විද්‍යාල ආචාර්ය, මහාචාර්යවරු අඛණ්ඩ වර්ජනයක නිරතව සිටියහ. මෙම අර්බුදයන් රැසකටම මූලික හේතුව අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරිමයි. යුනෙස්කෝ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලදුව, ශ්‍රී ලංකාවේ ආණ්ඩු විසින්ද වරින් වර පිළිගනු ලැබූ යෝජනාවක් වන දළ දේශීය නිශ්පාදිතයෙන් 6% අධ්‍යාපනයට වෙන් කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි

**(යෝ/v(01)12/16)**

## X. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.02.20 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
5 වන මහළ, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

File Name :- C:\Users\ishani maddumage\Documents\Office\Council\Agenda – 2013.02.20 docx